# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site


මගේ අංකය / எனது இல / My No: CS/DOS/14/01

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி: / Date: 2018.12.06

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

**දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත**

**<u>සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම</u>**

සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු ඇමුණුමෙහි සඳහන් II ශ්‍රේණියට උසස් කිරීමට අදාළ ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර නිලධාරියාගේ/ නිලධාරිනියගේ යාවත්කාලීන කරන ලද චර්යා සටහනෙහි සහතික කළ පිටපතක් සමඟ **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය** සහිතව මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

02. තවද, පරිවාස කාලය සම්පූර්ණ කරන ලද දිනයට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති නිලධාරියෙකු/ නිලධාරිනියක වෙතොත්, නියමිත කාලසීමාව තුළ සියලු කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා තිබේද යන්නත්, නිලධාරියා/නිලධාරිනිය කාර්යක්ෂමතා කඩඉම් විභාග නිසි කාලසීමාව තුළ සමත් නොවීම හේතුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවත් දන්වා එවන මෙන් වැඩිදුරටත් දැනුම් දෙමි.

03. ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 05/2018 ප්‍රකාරව වසර 10කට වැඩි එහෙත් වසර 20කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ සඳහන් අනෙකුත් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 2011.08.01 දිනට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදී. එහිදී අන්තර්ග්‍රහණය කරන ලද දිනට වසර 10කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ එකී වසර 10ට වඩා වැඩියෙන් වන සේවා කාලය I ශ්‍රේණියට උසස් කිරීමේදී, සළකනු ලබන බව තවදුරටත් දන්වා සිටිමි.

**(ඉහත සඳහන් ලිපිලේඛන යොමුකිරීමේදී නිලධාරියාගේ/ නිලධාරිනියගේ පත්වීම් ලිපි අංකය (CS/DOS/A/XXXXX) සඳහන් කිරීමට කාරුණික වන්න)**

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**

**සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට සාමාන්‍ය කාර්යය සාධනය මත උසස් කිරීම සඳහා වූ ආදර්ශ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමඟ නම :
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :
3. උපන් දිනය :
4. ජාතික හැඳුනුම්පත් අංකය :
5. සංවර්ධන නිලධාරි අන්තර්ග්‍රහණ ලිපියේ සඳහන් පත්වීම් අංකය :
6. මුල් පත්වීම් දිනය :
7. පත්වීම ස්ථිර කළ දිනය :
8. කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය :
9. III ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සම්පූර්ණ කළ දිනය :
10. දැනට සේවය කරන කාර්යාලය :

...................................................... දින සිට සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

......................................
අයදුම්කරුගේ අත්සන

....................................
දිනය

---

මාගේ අංකය :

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

........................................................................................................................ මහතා/ මහත්මිය/මෙනවිය

මෙම කාර්යාලයේ සේවය කරන අතර

1. ...................................................... දිනට වසර 10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්,
2. නියමිත වැටුප් වර්ධක 10 උපයාගෙන ඇති බවත්,
3. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබෙන බවත්,
4. එම වසර 10 තුළ අඩවැටුප් සහ වැටුප් රහිත නිවාඩු ගණන ..................................ක් බවත්/ අඩවැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත්,
5. එම කාලය තුළ කිසිම දඬුවමකට (අවවාද කිරීමක් හැර) යටත් කර නොමැති බවත්,
6. නිලධාරියාට/ නිලධාරිනියට විරුද්ධව විනය කටයුතු කිසිවක් නොමැති බවත්/ ඉදිරියේදී විනය ක්‍රියාමාර්ග ගැනීමට දැනට අදහස් නොකරන බවත්,
7. III වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී ඇති බවත්,
8. ................................................ දින සිට පත්වීම ස්ථිර කර ඇති බවත්,
   සඳහන් කරමි.

මෙම නිලධාරියා/ නිලධාරිනිය සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බැවින් .............................. දින සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම :
පදවි නාමය :
**( නිල මුද්‍රාව තබන්න)**

.....................................
දිනය

D:\Web\Monthly Web Uploading\2018\12. December\Web Publish\cls II application.docx